**ඉහළ** කරන්නාගොඩ සහ මානානේ කීප දෙනෙකු එකතු වී මානාන ප්‍රදේශයේ අලුතින් පිහිටුවා ගත් පන්සල පිළිබඳව ඇති මතකය සිත තුළ ඇති කරන්නේ චමත්කාර-ජනක හක්තිමත් හැඟීමකි. මානානේ තේ ඉස්ටෝරුවට චුට්ටක් ඉහළින් දකුණු අත පැත්තේ බිම් කඩක අලුත් පන්සල ඇරඹිණි. මෙම පන්සලේ නායක හාමුදුරුවන් වූයේ නාන්දූවේ පන්සලේ වැඩ විසූ මගුරේ ශ්‍රී සෝමානන්ද නායක ස්වාමීන් වහන්සේ ය.

කරන්නාගොඩ ශ්‍රී ශීලානන්දාරාමය නම් වූ මෙම පන්සල ආරම්භ කළ සන්දියේ දිනපතා පහන් පිංකම් පැවැත්විණි. සමහරක් දාට පෙරහැර ද සහිතව පිංකම් පැවැත්විණි. දවසකට ගමේ කවුරු හෝ පිංකමේ දායකත්වය උසුලයි. පිංකම භාර ගන්නා පිංවතා ගිලන්පස සකස් කළ යුතු ය. මල්වට්ටි වෙන්දේසියට මල්වට්ටිය සකස් කළ යුතු ය. සෙනඟ වැඩි වැඩියෙන් රැස් කර ගැනීමට උනන්දු විය යුතු ය. පොල් තෙල් සැපයිය යුතු ය. දැහැත් වට්ටිය සෑදිය යුතු ය. පහන් පත්තු කළ යුතු ය. පැට්‍රෝමැක්ස් ලාම්පුවට භූමිතෙල් සපයා ගෙන ලාම්පුව පත්තු කළ යුතු ය. යනාදී වගකීම් රැසක බර සතුටින් ඉසිලිය යුතුව තිබිණි.

ලී කණු සිටුවා තාර ෂීට් හෙවිලිකර බණ මඩුව සකස් කර වටේ කටුමැටි තාප්පයක් බැඳ තිබුණි. බිම ගොම මැටි ය. ඒ තුළ ම බුදුගෙය සාදා තිබුණි. හාමුදුරුවන්ගේ ආවාස ගෙය සඳහා ද ඒ තුළ ම පැත්තක කොටසක් වෙන් කොට තිබුණි.

කරති. කඩේ චන්ද්‍රදාස, පියතිලක බාප්පා, අනුර මහත්තයා, යෝමතිස්ස ආදී කොලුකුරුට්ටන් කීප දෙනෙක් ම හක්ගෙඩිය පිඹින වටේ කට ඇරගෙන බලා සිටින්නෙමු.

මල් පූජාව පටන් ගන්නා විට සියලු ම දෙනා පේළියට සිටිය යුතු වේ. මල්වට්ටි, හඳුන්කූරු, ගිලන්පස, පහන් අත ගස්වා ගෙන යාමට ළමයි සියල්ලෝ ම පොරකති. වැඩි හිටි අයෙක් ගිලන්පස භාජන සහිත පූජාව සියලු ම දෙනාට අත ගස්වයි. අත ගසන විට "සාදු සාදු සාදු සාදු සා.............දූ'' යනුවෙන් හැම අයෙකුගේ ම මුවින් පිට වෙයි. මල් පූජා කිරීමෙන් අනතුරු ව සියලු දෙනා ම බණ මඩුව තුළ වාඩි වී හාමුදුරුවන් අනුව ගාථා කියති. ඊට පසු ධර්ම දේශනාව යි. සමහර දාට පන්සලේ හාමුදුරු-වන්ට අමතර ව වෙනත් පන්සලකින් වඩම්මවන ලද ස්වාමීන් වහන්සේලා ලවා ද ධර්ම දේශනා කරවති.

ඊ ළඟට මල්වට්ටි වෙන්දේසිය යි. මල්වට්ටි වෙන්දේසිය සඳහා ඉතා අලංකාර ලෙස සකස් කළ මල් වට්ටියක් ඇත. මල් වට්ටිය වෙන්දේසි කිරීම වැඩි වශයෙන් අරඹන්නේ ලිහිනිස් මුදලාලි ය. සුනිල් මහත්තයා ද, විනී මහත්තයා ද මල් වට්ටිය වෙන්දේසි කරනවා මට මතක ය. මුදලාලි මුලින් ම මල් වට්ටිය අත්ල උඩට ගෙන වටේ කරකවා එහි හැඩ බලයි. ඉන්පසු එය වම් අතේ අල්ල උඩට ගනියි.




# අලුත් පන්සල

## නිර්මාණකරුවකුගේ මතක සටහන්

**සනත් පියසේන**

පිංකම පැවැත්වෙන වේලාවට මෙම ශාලාවේ දෙපස මාගල් එළනු ලැබේ. මාගල් එළුවාට පසු හිස් ව තිබෙන්නේ එක් අයකුට පමණක් පයින් එහෙට මෙහෙට යා හැකි තරමේ පුංචි බිම් තීරුවකි. මල් වට්ටි වෙන්දේසි කරන කෙනා පාවිච්චි කරන්නේ එම කුඩා ඉඩ කොටස යි.

සවස හය, හයහමාර පමණ වනවිට වටපිටාවෙන් එකතුවෙන විශාල පිරිසක් පන්සලේ ය. ඉහළ කරන්නාගොඩින්, කටුහේනෙන්, පුවක්වතුගොඩෙන්, කොණ්ඩවල ගොඩැල්ලෙන්, මානානෙන් එකතු වන පිරිස බොහෝ ය.

අපේ ගෙදර මැණිකෙ පොඩිඅම්මා, පියසීලි පොඩිඅම්මා, පහළ ගෙදර ඉන්ද්‍රානැන්දා. චන්ද්‍රවතීනැන්දා, ශීලානැන්දා, ලීලානැන්දා, කඩේ දයාඅක්කා, පහළ ආරිනැන්දා, දයා-නැන්දා, ආදී එක පෙළේ පිරිසද, අපේ ආච්චිලාගේ පෙළේ වයසක උපාසිකා පිරිස ද, අපේ පෙළේ කොලු කුරුට්ටන් පිරිස ද වැළ නො කැඩී පන්සලට ඇදෙති. වැඩිහිටි පිරිමි වරින්වර එක්කෙනා, දෙන්නා, තුන්දෙනා වශයෙන් පැමිණෙති. සමහර පිරිමි කවදාවත් පන්සල් යන්නේ ම නැත.

*<u>එම ලේන්සුව ලබා ගැනීමට ඒ දින පන්සලට පැමිණ සිටි තරුණ පිරිස ලන්සුව උස්සමින් පොර කන්නට වූහ. කෙසේ නමුත් එවකට ශත විසි පහක් පමණ වටිනාකමින් යුතු වූ එම ලේන්සුව රුපියල් හතරකුත් සත ගණනකට වෙන්දේසි විය. වෙන්දේ-සියෙන් අනතුරු ව මෙම ලේන්සුව කෝලාහලයකට තුඩු දෙන ආකාරයේ සිද්ධියකට ද හේතු වූවත් ලොකු හාමුදුරු-වන්ගේ මැදිහත් වීම නිසා එම රණ්ඩුව නැවතිණි.</u>*

ශබ්ද පූජා පැවැත්වීම පිණිස සංධාරයක් තිබුණේ නැත. සෑම ශබ්ද පූජාවක් ම පැවැත්වූයේ හක් ගෙඩියෙනි. පිංකම "තව ටිකකින් පටන් ගන්නා බව " සංනිවේදනය කරන්නේ ද හක් ගෙඩිය යි. සියලු ම දෙනා පෙළට සෑදී මල් ගිලන්පස පූජාව තබන විට පිඹින්නේ ද හක් ගෙඩිය යි.

"පූහ්හ්හ්........හ්හොඃ" යන ශබ්දය බොහෝ වේලාවක් ඇද පිඹින්නට පුළුවන් කම තිබුණේ චන්ද්‍රදාස නමැති තරුණ අයෙකුට ය. ඇල්විස් ආතා සහ චන්ද්‍රදාස පන්සලේ බොහෝ වැඩ කටයුතුවල දී ඉතා උනන්දුවෙන් කටයුතු

කලාශූරී සනත් පියසේනයන් විසින් ලියන ලද'' පොඩි කොලුවයි ගමයි ගඟයි'' ග්‍රන්ථය ශ්‍රී ලංකා අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මගින් පාසල් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කර ඇත.මේ පොත තැපැල් මගින් ලබා ගැනීමට පහත ලිපිනයෙන් විමසන්න.
සනත් පියසේන
නොඃ33 ජර්මන් හිත මිතු ගම
මාකන්දන- -මඩපාත-ශ්‍රී ලංකාව
RES: 94-1-2702899
MO: 0776434146

"හා දැන් ඔක්කොම එක්ක හොඳවයින් සාදු කාරයක් දෙමු බලන්න"

"සාදු සාදු සාදු සාදු සා..............දූ"

"මදි මදි. කෝ හයියෙන් කට ඇරල ආයිත් සාදුකා.."

"ෂාධු ෂාධු ෂාධු ෂාධු ඡ්හා.......................ධූ" යි මහා ගැඹුරු හඬින් හඬ නගා කියන්නේ මුදලාලිගේ වැකිය ඉවර කරන්නත් පෙරාතුව ය.

පුටුවක වැඩහිඳින නායක හාමුදුරුවන්ගේ මුහුණේ සිහින් සිනා ඉරකි.

"හා නමෝ විත්තියෙන් ලන්සුවක් තියමු බලන්න" ලිහිනිස් මුදලාලි උගුරේ රැල්බුරුල් හැර කියයි.

"සත දහයයි." සෙනඟ අතරින් එක් අයෙක් කෑ ගසයි.

"සත දහයයි" එයම නැවත උච්චාරණය කරන මුදලාලි "සත දහයයි ඈවරයි. සත දහයයි ඈවරයි" කියන විට ම

" පහළොහ යි"

"පහළොහ යි ඈවර යි"

"එක විට ම "සත දාසයයි" යනුවෙන් දෙපළකින් ම කියැවෙයි.

"දාසය දෙපළෙ" යනුවෙන් මුදලාලි කියන විට දාහතයි යනුවෙන් එක් අයෙක් කෑ ගසයි.

ටික වේලාවක් මල් වට්ටිය වෙන්දේසි කරන මුදලාලි වෙන්දේසි කිරීම වෙන අයෙකුට පවරන්නේ " මෙන්න මේක ගනින් බං උඹත් ටිකක් වෙන්දේසි කරපන්" කියමිනි. වරින්වර අතින් අත මාරුවෙන මල්වට්ටිය, බොහෝවිට වෙන්දේසිය තුන් ඈවර කරන්නේ ද මුදලාලි ම ය.

"ටිකෙන් ටික ඉහළ යන මුදල සමහර දාට රුපියල් පනහ ද ඉක්මව යි. අපි ද සත පහක් දහයක් තබා ගෙන මල් වට්ටිය ලබා ගැනීමට සිතා බොහෝ පසු වී ලන්සුව තබන්නෙමු. කෙසේ නමුත් මටද එක දවසක් මල්වට්ටිය ලබා ගැනීමට හැකි විය. මා පටස් ගා නැගිට ජංගිය දෑතින් ම අල්ලා උඩට ඇද උස්සා බඩ පුම්බා ගෙන මල්වට්ටිය රැගෙන හැම දෙනා ළඟට ම ගොස් අත ගස්වා පුංචි බුදු ගෙය තුළට පූජා කළේ ආච්චිත් සමග ය.

අඩු ම මුදලකට මල් වට්ටිය වෙන්දේසි වූ දවසද මගේ මතකයට එයි. එදා මල් වට්ටිය වෙන්දේසි වූයේ රුපියල් පහකටත් අඩු මුදලකට ය. එසේ වූයේ එක දිගට දින කීපයක් ම වැස්ස තිබුණු අවදියක ය. එම දින ගණනාවේ ම මල් වට්ටිය වෙන්දේසි වූයේ බොහෝ අඩු මුදලකට ය.

වැස්ස නො කඩවා ම පවතින කාලයට ගමේ බොහෙ-ා් දෙනෙකුට ම වාගේ සෑහෙන අඟහිඟකම් තිබුණි. ගංවතුර නිසා මහ වෙල පැත්තේ ජීවත්වන අයට මෙන් ම ගොඩ මණ්ඩියේ ජීවත්වන අයගේ ද ජීවන මාගී බො-හෝ සෙයින් ඇන හිටියි. මා දුටු තරමින් ප්‍රධාන ආදායම් මාර්ගය රබර් වීම මෙයට හේතුව වශයෙන් විශ්වාස කළහැක. මොන කරදර තිබුණ ද, ලැබෙන මුදල කොතෙක් අඩු වුවත්, කෙසේ හෝ දිනපතා පිංකම පැවැත්විය යුතු ය යන අධිෂ්ඨානයෙන් කවුරුත් කටයුතු කළ නිසාදෝ සෙනඟ අඩු වීමක් ද නො විණ.

සති කීපයකට වරක් භාණ්ඩ සල්පිල ද පැවැත්වේ. මිල කළ හැකි කිසියම් වූ භාණ්ඩයක් බැගින් එකතු කොට ඒවා වෙන්දේ-සියේ තබා මුදල් උපයා ගෙන සංවර්ධන වැඩ කටයුතුවලට යෙදීම සිදු කෙරුණි. සල්පිල් භාණ්ඩ වෙන්දේසිය මල් වට්ටි වෙන්දේසිය මෙන් නොවේ. කිසියම් වූ භාණ්ඩයකට ලන්සුව තබා එය තුන් ඈවර වන මුදල සම්පූර්ණයෙන් ගෙවා භාණ්ඩය ලබා ගත යුතු ය. අඩු මුදලකින් ඇරැඹෙන ලන්සුව භාණ්ඩයේ වටිනාකමට අඩුවෙන් තුන්ඈවර වන අවස්ථා ද, වටිනාකමට ඉහළ මුදලකට ලන්සුව ඈවර වන අවස්ථා ද තිබුණි. එසේ අඩු වටිනාකමක-ින් යුතු අත් ලෙන්සුවක් ඉතා ඉහළ මිලකට, අලෙවි වුණු අවස්ථාවක් පිළිබඳ මතකය කියයි. මෙම අත් ලේන්සුවේ මල් මසා තිබූ අතර ULR යන අකුරු තුන මසා තිබූ බව එම අකුරු තුන විටින් විට කීම නිසා මතකයේ රැඳී ඇත. එම ලේන්සුව ලබා ගැනීමට ඒ දින පන්සලට පැමිණ සිටි තරුණ පිරිස ලන්සුව උස්සමින් පොර කන්නට වූහ. කෙසේ නමුත් එවකට ශත විසි පහක් පමණ වටිනාකමින් යුතු වූ එම ලේන්සුව රුපියල් හතරකුත් සත ගණනකට වෙන්දේසි විය. වෙන්දේසියෙන් අනතුරු ව මෙම ලේන්සුව කෝලාහලයකට තුඩු දෙන ආකාරයේ සිද්ධියකට ද හේතු වූවත් ලොකු හාමුදුරුවන්ගේ මැදිහත් වීම නිසා එම රණ්ඩුව නැවතිණි. ලේන්සුව හිමිකර ගත් තැනැත්තාටත් එය අහිමි කරමින් '' ගිලන්පස පූජාව වහන්න මේක හොඳා'' යනුවෙන් පවසා ස්ථානෝචිත ප්‍රඥාවෙන් ස්වාමීන් වහන්සේ කළ එම ක්‍රියාව කෙතරම් නැණවත් ද යන්න පුංචි අපට එදා නො වැටහුණත් අද සිහිපත් කරන්නේ විශ්මයෙනි. එම ලේන්සුව වෙන්දේසි වූවාට පසු අපේ ආච්චි අපේ පොඩිඅම්මලාවද එක්කරගෙන මොන මොනවාදෝ බාලවූ කට හඬින් කියවමින් මාවද ඇද ගෙන ගෙදර ගියා ය.

''පින්වතෙක් - කජු මුලක්'' යනුවෙන් ලේබලය අලවා තිබූ පාර්සලයක කජු ගසක මුලක් තිබීම නිසා තවත් දිනක රණ්ඩුවක් ඇවිලෙන්නට ගියද එහි සඳහන්ව තිබුණේ කෙනෙකුගේ නමක් නොව ''පින්වතෙකු'' වීමෙන් වචන හුවමාරුවකින් පමණක් එම රණ්ඩුව කෙළවර වුණු අතර ඒ දින ඊටපසු වෙන්දේසි කළ සියලු ම පාර්සල් විවෘත කිරී-මෙන් පසු වෙන්දේසි කළහ.

එක දවසක් ලොකුහාමුදුරුවෝ මට ළඟට කථා කළහ. එය හාමුදුරුවෝ මුලින්ම මා සමග කතා කළ දවස යි. මම හාමුදුරුවන් ළඟට ගොස් බිම වැටී වැන්දෙමි.

"උඹේ නම මොකක්ද කීවෙ?"
"පියසේන"
"ඉස්කෝලෙ කීයෙද?"
"දෙකේ"

"මේ පාර කී වෙනියද?"

"පළවෙනිය"

"උඹ කැමති නැද්ද කොල්ලො මහණ වෙන්න"

මම බිම බලා ගෙන ඇඟ දෙපසට කරකවමින් මාපටැඟිල්ලෙන් පොළොව හාරහාරා සිටියෙමි.

"මෙහෙ බලපන් පියසේන. උඹට හොඳට ඉගෙන ගන්න උණත් පුළුවනි. දානෙ හෙමත් හොඳට ලැබෙනවනෙ බං."

තෝමස් ආතාගේ තුන්මාසේ දානය දවසේ හාමුදුරුවන් ගෙදරට ම වැඩම වූ ආකාරය මට මැවී පෙනෙන්නට විය. පුංචි ම පුංචි හාමුදුරුවන්ගේ ත් පා දෝවනය කොට පා පිසදමා ගෙය තුළට වැඩම වූ අයුරු මගේ සිත් ගත් දර්ශනයක් විය. දහම් පාසලේ අපට උගන්වන සුමතිපාල මහත්තයාත් පුංචි ම හාමුදුරුවන්ටත් දණ ගසා වැන්දේ ය. වයසක ආතලා ආච්චිලාත් දන් පිළිගන්වා පුංචි හාමුදුරුවරුන්ට වඳිති. ඒ හාමුදුරුවරු සුවපත්වේවා යි තොල් මතුරනවා මා බලා ගෙන ය. හාමුදුරුවන්ට බෙදන පරිප්පු ව්‍යංජනේ දකින කොට කටට කෙළ උනයි. බැදපු අල, තෙල් දමපු මාළුමිරිස් හැම පිඟානක ම ඇත. දානය වැළඳීමෙන් පසු ගස්ලබු, අඹ, වරකා, අන්නාසි - පළතුරු කීයක් ජාති ද? කිරි පැණි, කෝපි, තැඹිලිවතුර, දැහැත් විට පිරිකර ආදිය ද මතකයට එයි.

"හා " කීවෙමි.

හාමුදුරුවෝ මගේ ඔළුව අත ගා "එහෙනං අම්මලාගෙන් අහල වරෙන්" යයි පැවසූහ.

මම ආච්චි සොයා දුවගෙන ගොසින් ඒ බව කීවෙමි. ආච්චි වෙන අයත් එක්ක වෙන වෙන කතා ය. මගේ මහණ වීම ගැන ආච්චි කැමැත්තක් දැක්වූ බවක් පේන්න නැත. " ලොකු දූගෙන් අහන් නැතුව මට පුළුවන්ද ඕවට උත්තර පත්තර බඳින්න. නේද ආබු අක්කේ."

මගේ මහණ වීම එතනින් කෙළවර විය.

වසර ගණනාවකින් පසු පන්සල තිබුණු බිම ''පන්සල් වත්ත'' යන පින්වන්ත නම පමණක් ඉතිරිකර ගෙන හිස් බිමක් බවට පත්ව තිබුණත්, ඒ කල ම වාගේ, එනම් 1957 ජනවාරි මස 04 වැනි දින මෙම පන්සලේ දී ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත් වූ, ඉහළ කරන්නාගොඩ කෝවිස් වීරක්කොඩි අප්පුහාමි මහතා සහ ඇල්පිනෝනා ලියනගේ මහත්මියගේ පුත් රුවනක් වූ යසපාල වීරක්කොඩි කුල කුමරුවා, අද කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රි ධර්ම මහා සංඝ සභාවේ කර්මාචාර්ය, විද්‍යාගම පුරාණ මහා විහාරය,(වෙද පන්සල) බණ්ඩාරගම පුණ්‍යවර්ධනාරාමය යන උභය විහාරාධිපති, දෙල්දූව රජයේ විද්‍යාලයේ විදුහල්පති ව සේවය කළ ශාස්ත්‍රපති කරන්නාගොඩ අමරවංශ ස්වාමිපාදයන් වහන්සේ ලෙසින් සාසන උන්නතියට කරනු ලබන අනුපමේය සේවාව කරන්නාගොඩට පමණක් නොව මුළු පස්යොදුන් කෝරළයට ම ආඩම්බරයකි.